# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2469/09 - 2025 දෙසැම්බර් මස 31 වැනි බදාදා - 2025.12.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

මුද්‍රාව

අනුර කුමාර දිසානායක

### ජනාධිපති විධානය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාවෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව Rebuilding Sri Lanka ජනාධිපති කාර්ය සාධක බලකායක් ස්ථාපිත කිරීම.

1. ගරු හරිනි අමරසූරිය මැතිතුමිය - අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය
2. ගරු එච්.එම්. විජිත හේරත් මැතිතුමා - විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍ය
3. ගරු ඒ.එච්.එම්.එච්. අබයරත්න මැතිතුමා - රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය
4. ගරු ලාල් කාන්ත මැතිතුමා - කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය
5. ගරු උපාලි පන්නිලගේ මැතිතුමා - ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍ය
6. ගරු සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා - කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍ය
7. ගරු බිමල් රත්නායක මැතිතුමා - ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය
8. ගරු නලින්ද ජයතිස්ස මැතිතුමා - සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය
9. ගරු අනිල් ජයන්ත ප්‍රනාන්දු මැතිතුමා - කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍ය
10. ගරු පටබැඳිගේ දම්මික මැතිතුමා - පරිසර අමාත්‍ය
11. ගරු සුසිල් රණසිංහ මැතිතුමා - නිවාස, ඉදිකිරීම් සහ ජලසම්පාදන අමාත්‍ය
12. ගරු හනීෆ් යූසුෆ් මැතිතුමා - ආණ්ඩුකාරවර, බස්නාහිර පළාත

13. ගරු අරුණ ජයසේකර මැතිතුමා - ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍ය
14. ආචාර්ය එන්. එස්. කුමානායක මැතිතුමා - ජනාධිපති ලේකම්
15. ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම මැතිතුමා - ලේකම්, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
16. එච්.එස්.එස්. තුයියකොන්තා මැතිතුමා - ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය
17. බී.කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති මැතිතුමා - අත්‍යාවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල් සහ ලේකම්, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය
18. ආචාර්ය හාන්ස් විජේසූරිය මැතිතුමා - ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක
19. එච්.එස්.කේ.ජේ. බණ්ඩාර මැතිතුමා - රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්
20. රෝහණ හෙට්ටිආරච්චි මැතිතුමා
21. මලර්මති ගංගාදරන් මැතිතුමිය
22. ජනාධිපති නීතිඥ උපුල් කුමාරප්පෙරුම මැතිතුමා
23. සමන්තා ද සිල්වා මැතිතුමිය
24. මන්දනා ඉස්මයිල් මැතිතුමිය
25. පරාක්‍රම දිසානායක මැතිතුමා

වෙත,

ශුභාශිංසන පූර්වකවයි!

මිනිස් ජීවිතවලට මෙන්ම පෞද්ගලික හා පොදු දේපළවලට ද අලාභහානි සිදු කරමින්, ශ්‍රී ලංකාවේ සියලුම ප්‍රදේශ කෙරෙහි බලපාන අයුරින්, දිට්වා සුළි කුණාටුව මගින් සිදු කරන ලද ව්‍යසනයේ ප්‍රතිඵලයක් ලෙස පශ්චාත් ආපදා පුනරුත්ථාපන හා ප්‍රතිසාධන කටයුතුවලට ප්‍රතිචාර දැක්වීම සඳහා ඉහළ මට්ටමේ මනා සම්බන්ධීකරණයෙන් යුතු ජාතික ප්‍රතිසාධන යාන්ත්‍රණයක් බලමුලුගැන්වීමේ කඩිනම් හා හදිසි අවශ්‍යතාවයක් පවතින හෙයින් ද,

තවද, ‘Rebuilding Sri Lanka’ මුලපිරුම සඳහා පැහැදිලි ලෙස නිර්වචනය කරන ලද නායකත්වයක්, සාක්ෂි මත පදනම් වූ ප්‍රමුඛතාවයක් සහ සියලු ආයතන අතර මනා සම්බන්ධීකරණයෙන් යුතු සැපයුම් යාන්ත්‍රණයක් සහිත පාලන සහ මෙහෙයුම් රාමුවක් ස්ථාපිත කිරීම අවශ්‍ය වන හෙයින් ද,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති අනුර කුමාර දිසානායක වන මම, පශ්චාත් ආපදා පුනරුත්ථාපන, ප්‍රතිසාධන සහ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා උපායමාර්ගික නායකත්වය, සම්බන්ධීකරණය, සංගත ප්‍රවේශය සහ අධීක්ෂණය කිරීම සඳහා වන “Rebuilding Sri Lanka ජනාධිපති කාර්ය සාධක බලකාය” මෙයින් ස්ථාපිත කරනු ලබන අතර, ඔබතුමන්ලාගේ විචක්ෂණභාවය, සාමාර්ථ්‍යය හා පක්ෂපාතීත්වය කෙරෙහි මහත් වූ භක්තිය හා විශ්වාසය තබමින්, පූර්වෝක්ත ඔබතුමන්ලා, එනම්,

1. ගරු හරිනි අමරසූරිය මැතිතුමිය - අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය
2. ගරු එච්.එම්. විජිත හේරත් මැතිතුමා - විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍ය
3. ගරු ඒ.එච්.එම්.එච්. අබයරත්න මැතිතුමා - රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය
4. ගරු ලාල් කාන්ත මැතිතුමා - කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය
5. ගරු උපාලි පන්නිලගේ මැතිතුමා - ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍ය
6. ගරු සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා - කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍ය
7. ගරු බිමල් රත්නායක මැතිතුමා - ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය
8. ගරු නලින්ද ජයතිස්ස මැතිතුමා - සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය
9. ගරු අනිල් ජයන්ත ප්‍රනාන්දු මැතිතුමා - කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍ය
10. ගරු පටබැඳිගේ දම්මික මැතිතුමා - පරිසර අමාත්‍ය
11. ගරු සුසිල් රණසිංහ මැතිතුමා - නිවාස, ඉදිකිරීම් සහ ජලසම්පාදන අමාත්‍ය
12. ගරු හනීෆ් යූසුෆ් මැතිතුමා - ආණ්ඩුකාරවර, බස්නාහිර පළාත
13. ගරු අරුණ ජයසේකර මැතිතුමා - ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍ය
14. ආචාර්ය එන්. එස්. කුමානායක මැතිතුමා - ජනාධිපති ලේකම්
15. ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම මැතිතුමා - ලේකම්, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

16. එච්.එස්.එස්. තුයියකොන්තා මැතිතුමා - ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය
17. බී.කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති මැතිතුමා - අත්‍යාවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල් සහ ලේකම්, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය
18. ආචාර්ය හාන්ස් විජේසූරිය මැතිතුමා - ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක
19. එච්.එස්.කේ.ජේ. බණ්ඩාර මැතිතුමා - රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්
20. රෝහණ හෙට්ටිආරච්චි මැතිතුමා
21. මලර්මති ගංගාදරන් මැතිතුමිය
22. ජනාධිපති නීතිඥ උපුල් කුමාරප්පෙරුම මැතිතුමා
23. සමන්තා ද සිල්වා මැතිතුමිය
24. මන්දනා ඉස්මයිල් මැතිතුමිය
25. පරාක්‍රම දිසානායක මැතිතුමා

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ අනෙකුත් ලිඛිත නීතිවල සඳහන් ප්‍රතිපාදනයන්ට යටත්ව, මතු දැක්වෙන කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා ඉහත කී ජනාධිපති කාර්ය සාධක බලකායේ සාමාජිකයන් ලෙස පත් කරමි.

එකී කාර්යයන් කවරේ ද යත්:

i. පහත සඳහන් නැවත ගොඩනැගීමේ ක්‍රියාකාරකම්වලදී, සමස්ත මහ පෙන්වීම, උපායමාර්ගික තීරණ ගැනීම, අන්තර් අමාත්‍යාංශ ගැටලු විසඳීම, ප්‍රධාන අරමුදල් සැපයීම් සහ ප්‍රතිසාධන හා ප්‍රතිසංස්කරණ තීරණ සඳහා මඟපෙන්වීම:-

   *අ.* මූලික අවශ්‍යතා, සනීපාරක්ෂාව සහ සෞඛ්‍යය නැවත ස්ථාපිත කිරීම
   *ආ.* මූලික යටිතල පහසුකම් නැවත ගොඩනැගීම
   *ඇ.* ජීවනෝපාය සහ වත්කම් ප්‍රමාණවත් ලෙස ඉහළ නැංවීම
   *ඈ.* දේශීය ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීම
   *ඉ.* ඩිජිටල් දත්ත පද්ධති සහ තීරණ සහාය යාන්ත්‍රණය ස්ථාපිත කිරීම
   *ඊ.* සන්නිවේදනය සහ පාර්ශවකාර සම්බන්ධතා වැඩිදියුණු කිරීම

ii. ප්‍රධාන කමිටුවේ තීරණ ක්‍රියාත්මක කිරීම, අදාළ ක්ෂේත්‍රයන්හි පුනරුත්ථාපනය, ප්‍රතිසාධනය, ප්‍රතිසංස්කරණය සහ අරමුදල් රැස් කිරීමේ මූලපිරීම් ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සහ ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා අදාළ ආංශික අමාත්‍යවරයාගේ සභාපතිත්වය යටතේ උප කමිටු පත් කිරීම.

ඒ අනුව, පහත සඳහන් උප කමිටු ඇතුළුව, අවශ්‍ය විය හැකි පරිදි උප කමිටු පිහිටුවීමට මෙම කාර්ය සාධක බලකාය වෙත මෙයින් බලය සහ අධිකාරිය පවරමි:

**1. පශ්චාත් ආපදා අවශ්‍යතා අගැයුම් කමිටුව**
ස්වභාවික ආපදාවෙන් සිදුවූ භෞතික හානි, ආර්ථික අලාභ සහ සමාජ බලපෑම් පිළිබඳ දත්ත එකතු කිරීම, විශ්ලේෂණය කිරීම සහ අගැයුම සහ අදාළ වෙනත් ඕනෑම කාර්යයක් මෙම කමිටුවේ වගකීම වනු ඇත.

**2. පොදු යටිතල පහසුකම් ප්‍රතිෂ්ඨාපනය කිරීමේ කමිටුව**
ප්‍රවාහනය, විදුලිය, ජලය, වාරිමාර්ග, සෞඛ්‍ය, අධ්‍යාපනය සහ විදුලි සංදේශ ඇතුළු බලපෑමට ලක් වූ පොදු යටිතල පහසුකම් පද්ධති පුනරුත්ථාපනය කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම, සම්පත් සම්බන්ධීකරණය කිරීම, කාලෝචිත ලෙස ක්‍රියාත්මක කිරීම, වැඩිදියුණු කළ තාක්ෂණික හා ආපදා ඔරොත්තු දීමේ ප්‍රමිතීන් පිළිපැදීම සහතික කිරීම සහ අදාළ වෙනත් ඕනෑම කාර්යයක් මෙම කමිටුව මඟින් අධීක්ෂණය කරනු ඇත.

**3. පීඩාවට පත් ප්‍රජාවන් සඳහා නිවාස ප්‍රතිෂ්ඨාපනය කිරීමේ කමිටුව**
ආරක්ෂිත කලාපවල සහ සමාජ සේවා හා පොදු පහසුකම් ඇති ප්‍රදේශවල සම්පත් සහ තාක්ෂණික සහාය ලබා දෙමින්, නිවාස ප්‍රතිසාධන සැලැස්මක් මත පදනම්ව, බලපෑමට ලක් වූ ප්‍රජාවන් සඳහා හානියට පත් නිවාස ප්‍රතිසංස්කරණය හෝ නව නිවාස ඉදිකිරීම සහ අදාළ වෙනත් ඕනෑම කාර්යයක් සඳහා මෙම කමිටුව සහාය ලබා දෙනු ඇත.

**4. දේශීය ආර්ථිකයන් සහ ජීවනෝපායන් පුනර්ජීවනය කිරීමේ කමිටුව**
මෙම කමිටුව විසින්, ආපදාවෙන් පීඩාවට පත් ජීවනෝපායයන් සහ ව්‍යාපාර කඩිනමින් ස්ථාවර කිරීමට සහාය ලබා දීම, ප්‍රධාන සැපයුම් දාම නැවත ගොඩනැගීම හා ප්‍රතිෂ්ඨාපනය කිරීම, මූල්‍ය සේවාවන් වෙත ප්‍රවේශය වැඩි

දියුණු කිරීම, ආර්ථික අවස්ථා සංවර්ධනය කිරීම සහ ආර්ථික වශයෙන් ශක්තිමත් ප්‍රජාවන් ප්‍රවර්ධනය කිරීම සඳහා සමස්ත ආර්ථික ප්‍රතිසාධන උපායමාර්ග සංවර්ධනය කර ක්‍රියාත්මක කිරීම පිණිස ව්‍යාපාර, කර්මාන්ත සහ ප්‍රජා සාමාජිකයන් මෙහෙයවීම සිදු කරනු ඇත.

**5. සමාජ යටිතල පහසුකම් ප්‍රතිෂ්ඨාපනය පිළිබඳ කමිටුව**

අධ්‍යාපනය, සෞඛ්‍යය, ජලය, සනීපාරක්ෂාව සහ සුභසාධන සහාය සඳහා ප්‍රවේශය ඇතුළු අත්‍යවශ්‍ය සමාජ සේවා ප්‍රතිෂ්ඨාපනය සම්බන්ධීකරණය කිරීම මෙම කමිටුව විසින් සිදු කරනු ඇත. රෝග ව්‍යාප්තිය වැළැක්වීම සහ සහන කඳවුරු සුදුසු තත්ත්වයන් යටතේ පවත්වාගෙන යාම සඳහා අධීක්ෂණය සහ උපදෙස් ලබා දීම ද කමිටුව විසින් සිදු කරනු ඇත.

**6. මූල්‍ය සහ අරමුදල් කමිටුව**

අංක 25/2260/801/028 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද "Rebuilding Sri Lanka අරමුදල් පාලක කමිටුව", ව්‍යවස්ථාපිත අරමුදලක් ලෙස විධිමත් කළ යුතු ය. එතෙක්, අරමුදල් රැස් කිරීම, අයවැය සැලසුම් කිරීම, පරිත්‍යාගශීලීන් සම්බන්ධීකරණය කිරීම සහ 'Rebuilding Sri Lanka අරමුදල' පවතින රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති රාමුව තුළ විනිවිදභාවයෙන් යුතුව උපයෝජනය කිරීම ඇතුළුව, අරමුදල් සම්පාදනය කිරීම, ප්‍රතිපාදන වෙන් කිරීම සහ මූල්‍ය සම්පත් භාවිතය අධීක්ෂණය කිරීම නිසි පරිදි සහ සුමට ලෙස කළමනාකරණය කිරීම සඳහා නිර්ණායක සකස් කිරීම පිණිස මෙම කමිටුව වෙත බලය පවරා ඇත.

**7. දත්ත සහ තොරතුරු පද්ධති පිළිබඳ කමිටුව**

පශ්චාත් ආපදා පුනරුත්ථාපන සහ ප්‍රතිසාධන අවශ්‍යතා හඳුනා ගැනීම සහ ඒ සඳහා ප්‍රමුඛතාව ලබා දීම, ප්‍රතිසාධන සැලසුම් උපායමාර්ග මෙහෙයවීම, ක්‍රියාත්මක කිරීම පිළිබඳ අධීක්ෂණය කිරීම සඳහා මෙන්ම අදාළ ආයතන සහ පාර්ශ්වකරුවන් අතර දත්ත හුවමාරුව සහ සම්බන්ධීකරණය ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය දත්ත සහ තොරතුරු පද්ධති තීරණය කිරීමේ සහ ස්ථාපිත කිරීමේ වගකීම මෙම කමිටුව වෙත පැවරී ඇත. සාක්ෂි මත පදනම් වූ තීරණ ගැනීම සහ සම්පත් වෙන් කිරීම ප්‍රශස්ත කිරීම සඳහා සහාය වීම පිණිස උසස් විශ්ලේෂණ මෙවලම්, පුරෝකථන ආකෘති සහ නව්‍ය තාක්ෂණයන් මෙයට අනුගත කරනු ඇත.

**8. මහජන සන්නිවේදනය පිළිබඳ කමිටුව**

ප්‍රතිසංස්කරණ සහ ප්‍රතිසාධන ව්‍යාපෘති හා වැඩසටහන් පිළිබඳ කාලීන නිවැරදි තොරතුරු ලබාදීම සහතික කරමින්, මහජන සන්නිවේදනය, දැනුවත් කිරීම සහ පාර්ශ්වකාර සම්බන්ධතා සම්බන්ධීකරණය කිරීම සඳහා ඵලදායී සන්නිවේදන උපායමාර්ගයක් හඳුන්වා දීම පිළිබඳ වගකීම, මෙම කමිටුව විසින් දරනු ඇත.

තවද, ඉහත කී කාර්ය සාධක බලකායේ සභාපති වශයෙන් අග්‍රාමාත්‍ය ගරු හරිනි අමරසූරිය මැතිතුමිය ද, එම කාර්ය සාධක බලකායේ ලේකම් වශයෙන් ජී.එම්.ආර්.ඩී. අපොන්සු මැතිතුමා ද පත් කරමි.

තවද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ අනෙකුත් ලිඛිත නීතිවල සඳහන් ප්‍රතිපාදනයන්ට යටත්ව, මෙයින් පවරනු ලබන කර්තව්‍යයන් ඉටුකරලීමට අදාළව අවශ්‍ය විය හැකි පරිදි කරුණු සොයා බැලීමට සහ උපදෙස් නිකුත් කිරීමට ද, ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් අදහස් කරනු ලබන රජයේ නිලධරයන්ගේ සහාය ලබා ගැනීමට ද, ජනාධිපති කාර්ය සාධක බලකායේ සාමාජිකයන් වන ඔබ වෙත මෙයින් බලය පවරමි.

තවද, එකී "Rebuilding Sri Lanka" ජනාධිපති කාර්ය සාධක බලකායේ සාමාජිකයින් වන ඔබ විසින්, ඉහත කාර්යයන් ඉටු කිරීම පිළිබඳව කලින් කලට මා වෙත වාර්තා ඉදිරිපත් කරන ලෙස ද මෙයින් දන්වමි.

වර්ෂ දෙදහස් විසි පහක් වූ දෙසැම්බර් මස 26 වන දින වූ මෙදින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ කොළඹ දී දෙන ලදී.

ගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ආචාර්ය එන්.එස්. කුමානායක,
ජනාධිපති ලේකම්.

EOG 12 - 0265

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.